(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(16).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 ජූලි 26 සිකුරාදා**

**2024 අගෝස්තු 06 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ආරක්ෂණ පියවර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27, 28 සහ 45 වගන්ති සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජුනි 06 දිනැති අංක 2387/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 මැයි 03 දිනැති අංක 2382/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජුනි 28 දිනැති අංක 2390/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.07.26 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

වර්ල්ඩ් ලයිෆ් ලයින් යෝගා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2024 අගෝස්තු 07 බදාදා)**

2152/2024

ගරු එරාන් වික්‍රමරත්න මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත, බුද්ධිමය දේපළ පනත සහ සී/ස ආශා මිනරල්ස් පුද්ගලික සමාගමට බොහෝ කලකට පෙර අවශ්‍ය බලපත්‍ර හිමිකාරිත්වය දැරූ සී/ස පුත්තලම ඉල්මනයිට් සමාගමෙහි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින්, ගවේෂණය හා සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් සී/ස ආශා මිනරල්ස් පුද්ගලික සමාගම සමඟ ගිවිසුමකට එළඹීමට පාදක වූ හේතු සහ ක්‍රමවේද කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කර්මාන්ත අමාත්‍යාංශයේ 2023.05.23 දිනැති ලිපිය සම්බන්ධයෙන් පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) සී/ස පුත්තලම ඉල්මනයිට් සමාගම විසින් 2023.10.19 දින මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයේ ප්‍රතිඵලය කවරේද;

(iii) මුදල් අමාත්‍යාංශය විසින් පිළිවෙලින් 2024.01.30 සහ 2024.03.11 යන දිනයන්හිදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත ලබා දුන් උපදෙස් පිළිනොපැදීමට හේතු කවරේද; සහ

(iv) රේඛීය අමාත්‍යාංශය සහ එකම කොටස් හිමියා වන භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත සිය අනුකූලතාවය බලාත්මක කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2024 අගෝස්තු 08 බ්‍රහස්පතින්දා)**

2146/2024

ගරු අසංක නවරත්න මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හලාවත, මහවැව පදිංචිව සිටි සෝලියස් මැන්දිස් කලාකරුවාට පෞද්ගලිකව අයිති ඉඩම්, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ පාලනයට පවරා දී තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් පවරා ඇති කාල වකවානුව කවරේද;

(iii) එම ඉඩම් පවරා ඇති ක්‍රමවේදය කවරේද;

(iv) ඊට අදාළ අවසාන කැමති පත්‍රය/ඔප්පුව කවරේද;

(v) පවරා ඇති එක් එක් ඉඩමේ නම, විශාලත්වය හා පිහිටා ඇති ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඉහත ඉඩම්, සම්මේලනය විසින් පසුකාලීනව අන්සතු කර තිබේද;

(vii) එසේ නම්, ඒ කුමන පදනම් යටතේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පැවරූ දින සිට මේ වනතෙක් ඉහත (අ)(v)හි සඳහන් එක් එක් ඉඩමෙන් වාර්ෂිකව උපයන ලද ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පැවරූ දින සිට මේ වනතෙක් එම ඉඩම්වල සහ ඒවායේ ඇති ගොඩනැගිලිවල දියුණුව හා ආරක්ෂාව සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) සෝලියස් මැන්දිස් මහතාට අයත් මහවැව පිහිටි ඉඩමක ඉදිකර ඇති "සිව්රාජ" ළමා නිවාසය සංවර්ධනය කිරීමට වැඩසටහනක් යෝජනා කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 අගෝස්තු 20 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1129/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට ජනතාව අතර බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය;

(iii) එම ඉඩම් අතරින් මේ වනවිට ඔප්පු ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය;

(iv) ඉදිරියේදී ඔප්පු ලබා දීමට නියමිත ඉඩම් ප්‍රමාණය;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1156/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා පමණක් අවසර ලබා දී ඇති වාහනවල මගීන් ප්‍රවාහනය කළ හැකිද;

(ii) එම වාහනවලින් මගීන් ප්‍රවාහනය කරනු ලබන බව දන්නේද;

(iii) එම වාහනවල මගීන් ප්‍රවාහනය කිරීම සඳහා ලබා දී ඇති නෛතික බලය කවරේද;

(iv) අනාරක්ෂිත ලෙස මගීන් ප්‍රවාහනය කරනු ලබන වාහන අනතුරුවලට ලක් වීම හේතුවෙන් මිය යන පුද්ගලයන් සංඛ්‍යාව ඉහළ ගොස් ඇති බව දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1246/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2019 වසරේ ශ්‍රී ලංකාවේ පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් ‘චැනල් 4’ නාලිකාව විසින් එල්ල කරන ලද චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කළ ජනාධිපති කොමිසමේ ප්‍රගතිය;

(ii) ඉහත කොමිෂන් සභා වාර්තාව මෙම සභාවට සහ මහජනතාවට ලබා දෙනු ලබන දිනය; සහ

(iii) එම විමර්ශනයේ ප්‍රගතියක් නොමැති නම් ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රහාර සම්බන්ධයෙන් ‘චැනල් 4’ නාලිකාව විසින් එල්ල කරන ලද එම චෝදනා විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට හේතු;

(ii) ඉහත කාරක සභාවේ ප්‍රගතිය;

(iii) ප්‍රගතියක් නොමැති නම්, ඊට හේතු; සහ

(iv) ඉහත කමිටුවේ පරාමිතීන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එකී ප්‍රහාර සම්බන්ධයෙන් ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට කරන ලද ඉල්ලීම් රජය දිගින් දිගටම නොසලකා හැර තිබීමට හේතු කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1251/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් කර ඇති නිරීක්ෂණ හා නිර්දේශ කවරේද;

(ii) ඔහු පොලිස් පරිපාලන අංශ ප්‍රධානී තනතුරට පත් කරන ලද දිනය, එම තනතුර සඳහා ඔහු නිර්දේශ කරන ලද දිනය සහ එම තනතුරට ඔහු නිර්දේශ කරන ලද පුද්ගලයන්ගේ හා ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති ඉහත නිලධාරියා එම තනතුරට පත් කිරීම සඳහා බලපෑ සාධක කවරේද;

(iv) ඉහත පත් කිරීම, නැවත සලකා බැලීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1287/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා එම අරමුදල මඟින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අරමුදලට මුදල් ලැබෙන මාර්ග කවරේද;

(v) එම අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1705/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශාල ලෙස ඉහළ ගොස් ඇති කෘෂි බීජ වර්ගවල මිල නියාමනය කිරීමට වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(ii) කෘෂි බීජ ආනයනය කිරීමේදී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන මැදිහත්වීම කවරේද;

(iii) ආනයනය කරනු ලබන කෘෂි බීජවල මිල පාලනය කිරීමට හා ඒවායේ ප්‍රමිතිය සහතික කිරීමට මැදිහත් වන්නේද;

(iv) එක් වර්ෂයක් තුළදී ආනයනය කරනු ලබන කෘෂි බීජ වර්ග, එම එක් එක් වර්ගයෙන් ආනයනය කරනු ලබන ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1731/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගමුව බන්ධනාගාරයේ පවතින අධික තදබදයට විසඳුමක් ලෙස එම බන්ධනාගාරය වෙන්නප්පුව ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(ii) ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා මූලික වියදමක් දරා තිබේ නම්, එම මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1745/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලයේ සිට කොළඹ දක්වා ධාවනය කරනු ලබන දුම්රිය, ත්‍රිකුණාමලයෙන් ගමන් ආරම්භ කරනු ලබන වේලාවන් සහ කොළඹට ලඟා වන වේලාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ත්‍රිකුණාමලය සිට කොළඹ දක්වා ධාවනය කරනු ලබන රාත්‍රී දුම්රිය අලුයම 3.30 ට කොළඹ කොටුව දුම්රිය ස්ථානය වෙත ළඟා වන බව දන්නේද,

(iii) කොළඹ නගරයේ පොදු ප්‍රවාහන සේවාවන් පෙරවරු 5.00 න් පසුව ආරම්භ කිරීම හේතුවෙන් ඉහත දුම්රියෙන් කොළඹට පැමිණෙන ජනතාව කොළඹදී පොදු ප්‍රවාහන සේවාවන් ලබා ගැනීම සඳහා දීර්ඝ වේලාවක් රැඳී සිටීමට සිදුවීමෙන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1754/2024

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ තැලසීමියා රෝගීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පුද්ගලික රෝහලකින් තැලසීමියා රෝගියකුට ජාන බද්ධ කිරීමේ ශල්‍යකර්මයක් සිදු කර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 48ක පමණ මුදලක් වැය වන බව දන්නේද;

(iii) එසේ නම්, ඉහත ශල්‍යකර්මය රජයේ රෝහල්වල සිදු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2005/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.31 දින වනවිට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ලංකාවේ ඖෂධ සැපයුම්කරුවන් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල, එක් එක් ඖෂධ සැපයුම්කරු අනුව;

(ii) ඉන්දියානු රජයේ ණය ආධාර මත ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ඖෂධ වෙනුවෙන් 2024.01.31 දින වනවිට ඉන්දීය ඖෂධ සැපයුම්කරුවන් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල, එක් එක් ඖෂධ සැපයුම්කරු අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 අගෝස්තු 21 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1879/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වකුගඩු රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීම පිණිස මාතලේ දිස්ත්‍රික්කයේ ඇති සෞඛ්‍ය මධ්‍යස්ථාන කවරේද;

(iii) එම මධ්‍යස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1920/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමවල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම යෝජනා ක්‍රමවල සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන වෘත්තීන් කවරේද;

(iii) වාර්ෂිකව එම යෝජනා ක්‍රමවල සාමාජිකත්වය ලබා ගන්නා සංඛ්‍යාව කොපමණද;

(iv) එම සාමාජිකයන්ට වාර්ෂිකව ලැබෙන ප්‍රතිලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයන් බඳවා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1945/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති උක් ප්‍රභේද සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රභේද කවරේද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන උක් ප්‍රභේද කවරේද;

(iv) මොලැසස් වැඩිම ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන උක් ප්‍රභේදය කවරේද;

(v) මොලැසස් අඩු ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන උක් ප්‍රභේද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1972/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ගවල සම්පූර්ණ දිග කිලෝමීටර්වලින් කොපමණද;

(ii) මේ වනවිට ධාවනය කරනු ලබන දුම්රිය එන්ජින් සංඛ්‍යාව සහ දුම්රිය මැදිරි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය කාලයේ ඉන්දියාවෙන් ආනයනය කරන ලද දුම්රිය මැදිරි හා එන්ජින් මේ වනවිට ධාවනයට යොදවා තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1995/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැඩි නියඟය හේතුවෙන් හම්බන්තොට, උඩවලව කලාපය, කිරම ඔය කලාපය සහ මලලආර කලාපය ඇතුළු ගිනිකොණදිග තැනිතලාවේ කලාප ගණනාවක වගා බිම් විනාශ වී ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා 'සුරකිමු රුහුණ' සංවිධානය විසින් යෝජනා කර ඇති, පැරණි වාරි සංරක්ෂණ පද්ධතිය විධිමත් කිරීම සහ තෙත් කලාපයේ අතිරික්ත ජලය ඉහත කලාපවලට යොමු කිරීම (කළු ගඟ හැරවීමේ ව්‍යාපෘතිය) යන විසඳුම් දෙක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පියවර ගන්නේද;

(iii) නොඑසේ නම්, ඉහත සඳහන් කලාපවල පවතින ජල හිඟය මඟහැරවීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කඩිනම් පියවර කවරේද;

(iv) මේ වනවිට නවතා දමා ඇති ගිං ගඟ, සහ නිල්වලා ගඟ ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2011/2024

ගරු මයන්ත දිසානායක මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ග්‍රාම නිලධාරී වසමේ නම සහ පිරිසිදු පානීය ජලය නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මහනුවර දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2026/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් වර්ෂයේ එක් කන්නයක් පමණක් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය, කන්න දෙකක් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය සහ කන්න තුනක් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ඉඩම්වල වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සැලසුම් කර තිබේද;

(iv) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2044/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ලබා ගන්නා ජනාධිපතිවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ජනාධිපතිවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ජනාධිපතිවරයාට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට ලබා දී ඇති, රජයේ දීමනා ලබන කාර්ය මණ්ඩලය, එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් ජනාධිපතිවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් යොදවා තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ජනාධිපතිවරයාගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ ආරක්ෂාව සඳහා යොදවා ඇති ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2058/2024

ගරු වේලු කුමාර් මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මව්වරුන් රැකියාවට යන අවස්ථාවලදී, ඔවුන්ගේ දරුවන් රඳවා තැබීම සඳහා ළමා රැකවරණ මධ්‍යස්ථාන (créche) වතුයායන් ආශ්‍රිතව ස්ථාපිතකර ඇති බව දන්නේද;

(ii) එම මධ්‍යස්ථාන වෙත ඇතුළත් කර ගනු ලබන ළමයින්ගේ වයස් සීමාව කොපමණද;

(iii) මේ වනවිට, එම මධ්‍යස්ථානවල රැකබලා ගනු ලබන ළමයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ළමා රැකවරණ මධ්‍යස්ථාන භාර පාලිකාවක් සපුරා තිබිය යුතු සුදුසුකම් කවරේද;

(ii) එම මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේදී අනුගමනය කළ යුතු ප්‍රමිතීන් හා රෙගුලාසි කවරේද;

(iii) එවැනි ප්‍රමිතීන් සහ රෙගුලාසි නොමැති නම්, ඒවා සම්පාදනය කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2139/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර, හාඩි උසස් තාක්ෂණ ආයතනයේ කෘෂි විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර මේ වනවිට වර්ෂ 04ක පමණ කාලයක් ගත වී ඇතත්, එම පාඨමාලාව හදාරන සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට අත්‍යවශ්‍ය අංගයන් වන බෝග ගොවිපළක්, සත්ත්ව ගොවිපළක්, කුඹුරක් සහ වාරිමාර්ග පහසුකම් යන යටිතල පහසුකම් සපුරා නොමැති බවත්;

(ii) කෘෂි අංශ භාර ප්‍රධානීන් විසින් ඉහත පාඨමාලාව නිසි පරිදි අධීක්ෂණය නොකිරීම හේතුවෙන් කෘෂි විද්‍යා පාඨමාලාව සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන අධ්‍යාපන චාරිකා සංවිධානය නොකරන බවත්;

(iii) කෘෂි විද්‍යා පාඨමාලාව හැදෑරීම සඳහා ඉහළ ඉල්ලුමක් පැවතියත් ඒ සඳහා අවශ්‍ය උපදේශකයන්ගේ හිඟය මගහරවා ගැනීම පිණිස බාහිර උපදේශකයන් බඳවා ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත ගැටලු සඳහා ලබා දෙන විසඳුම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2024 අගෝස්තු 22 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

6/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉදිකිරීම් කටයුතු හා සංවර්ධන කටයුතු සඳහා මේ වනවිට භාවිත කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම දෙපාර්තමේන්තුව සතු ඉඩම්, බදු පදනම මත පෞද්ගලික අංශයට ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම් ලබා දී ඇති සමාගම්/ආයතන කවරේද;

(v) ඉඩම් බදු දීම මඟින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

45/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශේෂ ආරක්ෂක දිසාව යටතේ පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයට අනුයුක්ත කර ඇති පොලිස් නිලධාරින් දවස පුරා ප්‍රභූ ආරක්ෂක රාජකාරියේ නිරත වන බවත්;

(ii) එසේ වුවද, ජනාධිපති, අගමැති හා ඇමැති ආරක්ෂක කොට්ඨාසයේ සේවය කරනු ලබන පොලිස් නිලධාරින්ට ලබා දෙන ඇතැම් වරප්‍රසාද හා දීමනා පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයට අනුයුක්ත කර ඇති පොලිස් නිලධාරින්ට ලබා නොදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයේ සේවය කරනු ලබන පොලිස් නිලධාරින්ට ලබා දෙන වරප්‍රසාද හා දීමනා කවරේද;

(ii) අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල සේවය කරනු ලබන පොලිස් නිලධාරින්ට ලබා දෙන වරප්‍රසාද හා දීමනා එක් එක් ප්‍රභූ ආරක්ෂක සේවාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයේ සේවය කරනු ලබන පොලිස් නිලධාරින්ට මේ වනවිට ලබා නොදෙන වරප්‍රසාද හා දීමනා ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

312/2024

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිය ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා මේ වනවිට ලංකා විදුලිබල මණ්ඩලය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

(ii) සූර්ය බල විදුලිය ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවන මුදල කොපමණද;

(iii) සූර්ය බලයෙන් විදුලිය නිෂ්පාදනය කිරීම ඉහළ නැංවීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(v) නොඑසේ නම්, එවැනි වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

359/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2021 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සිදු වූ —

(i) රිය අනතුරු සංඛ්‍යාව;

(ii) මාරක රිය අනතුරු සංඛ්‍යාව;

(iii) රිය අනතුරුවලින් මරණයට පත් වූ, පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ, බරපතළ තුවාල ලැබූ සහ සාමාන්‍ය තුවාල ලබා රෝහල් ගත වූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iv) රිය අනතුරුවලට ලක් වූ වාහන සංඛ්‍යාව;

(v) රිය අනතුරුවලට ලක් වූ වාහන අතරින් නැවත භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වූ වාහන සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රිය අනතුරු හේතුවෙන් රජයට වාර්ෂිකව වැය කිරීමට සිදු වී ඇති අතිරේක වැය බර ගණනය කර තිබේද;

(ii) එසේ නම්, එම වාර්ෂික අතිරේක වැය බර, සෞඛ්‍ය, මහාමාර්ග සහ ප්‍රවාහන යන එක් එක් ක්ෂේත්‍රය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

370/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල සේවය කරන ලද අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ තාවකාලික සේවකයන් 2019 වර්ෂයෙන් පසුව ඉවත් කර තිබේද;

(ii) එසේ ඉවත් කර ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඔවුන් ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉවත් කරන ලද එම සේවකයන් නැවත සේවයට කැඳවන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සේවකයන් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

375/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට තායිලන්තයේ ප්‍රතිකාර ලබන මුතුරාජා හස්තියා ශ්‍රී ලංකාවේදී වද හිංසාවලට ලක්වීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(iii) මුතුරාජා හස්තියා නැවත ශ්‍රී ලංකාවට රැගෙන ඒමට අපේක්ෂා කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ හීලෑ අලින් වද හිංසාවලට ලක්කිරීම් පිළිබඳව වාර්තා වී තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1245/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඩු ආදායම්ලාභී පවුල් සඳහා රැකියා ලක්ෂයක් ලබා දීමේ වැඩසටහන යටතේ පළමු අදියරේදී බඳවාගන්නා ලද රැකියාලාභීන් සංඛ්‍යාව, දෙවන අදියරේදී බඳවාගන්නා ලද රැකියාලාභීන් සංඛ්‍යාව සහ බඳවාගන්නා ලද රැකියාලාභීන් අතරින් මේ වනවිට සේවයේ යෙදී සිටින රැකියාලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට සේවයේ යෙදී සිටින රැකියාලාභීන් සඳහා ස්ථිර රැකියා ස්ථානයක් ලබා දී තිබේද;

(iii) ස්ථිර රැකියා ස්ථානයක් ලබා නොදුන් රැකියාලාභීන් සිටී නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත රැකියාලාභීන් සේවයේ ස්ථිර කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2088/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය ආරක්ෂක සේවය සඳහා අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවයේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) දුම්රිය මගීන්ගේ හා දුම්රිය දේපලවල ආරක්ෂාව සම්බන්ධයෙන් ඉතා වැදගත් සේවාවක් ඉටු කරනු ලබන එම සේවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2105/2024

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ''එක්ස්ප්‍රස් පර්ල්'' නෞකා අනතුරට අදාළව වන්දි අයකර ගැනීම සම්බන්ධයෙන් කරුණු සොයා බැලීම සඳහා විද්වත් කමිටුවක් පත් කරන ලද දිනය කවරේද;

(ii) එම කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සාමාජිකයාගේ නම, තනතුර, ලිපිනය හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම කමිටුවේ රැස්වීම් පවත්වන ලද දින සංඛ්‍යාව හා එම දින වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත කමිටුව අක්‍රිය වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපා ඇති හේතු කවරේද;

(iii) ඉහත කමිටුව අක්‍රිය වී ඇති තත්ත්වය තුළ ''එක්ස්ප්‍රස් පර්ල්'' නෞකා අනතුරට අදාළව වන්දි අයකර ගැනීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2151/2024

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ හෙද විද්‍යාල සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම පාසල් විසින් පවත්වනු ලබන එක් එක් පුහුණු පාඨමාලාවේ අන්තර්ගතය සහ පුහුණු කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) හෙද පුහුණුව අවසන් කරනු ලබන අභ්‍යාසලාභීන්ට ලබා දෙන සහතික කවරේද;

(iv) වාර්ෂිකව පුහුණුව අවසන් කරනු ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව එක් එක් පාසල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ හෙද විද්‍යාල මඟින් හෙද පුහුණුව ලැබූ අභ්‍යාසලාභීන් අනිවාර්යයෙන්ම රජයේ රෝහල්වල සේවය කළ යුතු වන්නේද;

(ii) නොඑසේ නම්, පෞද්ගලික හෝ විදේශීය රෝහල්වල සේවය කිරීමට අවසර තිබේද;

(iii) ඔවුන්ට රජයේ රෝහල්වලට පත්වීම් ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) රජයේ රෝහල්වල හෙද තනතුරේ වර්ෂයකට ඇති වන පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම සංඛ්‍යාව පිරවීම සඳහා රජයේ හෙද විද්‍යාලවල පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(vi) නොඑසේ නම්, එම පුරප්පාඩු පිරවීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 අගෝස්තු 23 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

382/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාහන වායු විමෝචන භාරකාර අරමුදල පිහිටුවන ලද දිනය කවරේද;

(ii) එම අරමුදල පිහිටුවීමේ අරමුණු/පරමාර්ථ කවරේද;

(iii) එම අරමුදලේ සාමාජිකයන් කවුරුන්ද;

(iv) වායු විමෝචන සහතික නිකුත් කරනු ලබන ආයතන විසින් ඉහත අරමුදල වෙත මාසිකව ලබා දිය යුතු මුදල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) ඒ අනුව ආරම්භ කරන ලද වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනවලින් ඉහත අරමුදලට ලැබී ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදලේ ආරම්භක අරමුණු/පරමාර්ථ අනුව කටයුතු කිරීම සඳහා දිගුකාලීන සංයුක්ත සැලැස්මක් හෝ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්, අරමුදලේ භාරකාර මණ්ඩලය විසින් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද;

(iii) එම සැලසුම්වලට අනුව අරමුදල විසින් මේ දක්වා වැය කර ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

467/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට කසළ ප්ලාස්ටික් ආනයනය තහනම් කිරීමට තීරණය කරන ලද දිනය කවරේද;

(ii) වර්ෂ 2018 සිට මේ දක්වා ආනයනය කරන ලද කසළ ප්ලාස්ටික් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මධ්‍යම පරිසර අධිකාරිය විසින් කසළ ප්ලාස්ටික් ආනයනය කිරීමට අවසර ලබා දී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) කසළ ප්ලාස්ටික් ආනයනය තහනම් කිරීමට තීරණය කර තිබියදී, මධ්‍යම පරිසර අධිකාරිය විසින් කසළ ප්ලාස්ටික් ආනයනය කිරීම සඳහා ආයතන කිහිපයකට අවසර ලබා දීමට තීරණය කිරීම සඳහා පදනම් වූ කරුණු කවරේද;

(vi) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

513/2024

ගරු රෝහණ බංඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහකනදරාව ව්‍යාපාරය යටතේ මේ වනවිට වගා කරනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපාරය යටතේ කුඹුරු වගා කරන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) මහකනදරාව ව්‍යාපාරය යටතේ කුඹුරු වගා කරනු ලබන ගොවීන්ට වාරිමාර්ග නිලධාරින් විසින් තර්ජනය කර ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

544/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දේශපාලන පළිගැනීම්වලට ලක් වූ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් විමර්ශන කර තිබේද;

(iii) එම විමර්ශන අනුව සහන ලබා දී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) සහන නොලැබූ සේවකයන්ට ඉදිරියේදී සහන සැලසීමට කටයුතු කරන්නේද;

(v) සහන ලබා නොදෙන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

564/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා රජය විසින් රෝපණය කිරීම සඳහා ලබා දී ඇති පොල් පැළ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා ලබා දෙන ලද ප්‍රදේශ සහ පැළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පොල් පැළ නිසි පරිදි වර්ධනය වන්නේදැයි පසුවිපරම් කරන්නේද;

(iv) එම පොල් පැළ අතරින් නිසි පරිදි වර්ධනය වෙමින් පවතින පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

(v) ඉදිරි වර්ෂය සඳහා බෙදා දීමට අපේක්ෂිත පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

592/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විශ්‍රාම වැටුප් ලබා ගත් හා මේ වනවිට විශ්‍රාම වැටුප් ලබා ගනිමින් සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව හා එම එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ විශ්‍රාම වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මන්ත්‍රීවරුන් අතරින් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන ලද මන්ත්‍රීවරුන් සංඛ්‍යාව, එම එක් එක් මන්ත්‍රීවරයාගේ විශ්‍රාම වැටුප හා සේවා කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විශ්‍රාම වැටුප් හිමිකම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සම්පූර්ණ කළ යුතු සේවා කාලය කොපමණද;

(iv) වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හිමි විශ්‍රාම වැටුප කොපමණද;

(v) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ විශ්‍රාම වැටුප, සේවා කාලය අනුව වෙනස් වන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

614/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දෙන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන අතරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කර ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එලෙස ලියාපදිංචි කර නොමැති ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම ආයතන සංඛ්‍යාව, ඒවායේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කර ඇති සහ නොමැති ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ලබා දී ඇති ණය සංඛ්‍යාව හා එම ආයතනවල පොළී ප්‍රතිශත වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් ණය ගෙවීම ආරම්භ කිරීම සඳහා සහන කාලයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සහන කාලය කොපමණද;

(iii) ණය නිසි පරිදි නොගෙවන පුද්ගලයන්ට ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල නිලධාරින් විසින් ශාරීරික හා මානසික හිංසා සිදු කරන බව දන්නේද;

(iv) එසේ නම්, එම ආයතනවලට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

(v) ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කළ යුතු බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම නියාමන වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

639/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුළු පොල් නිෂ්පාදනය එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී මුළු පොල් නිෂ්පාදනය උච්ඡාවචනය වී ඇති ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කොපමණද;

(ii) තේ අපනයනය කිරීමෙන් එම වර්ෂයේදී උපයාගෙන ඇති ආදායම කොපමණද;

(iii) තේ පර්යේෂණ ආයතනය සහ පොල් පර්යේෂණ ආයතනය ඇතුළු වැවිලි බෝග සඳහා පිහිටුවා ඇති පර්යේෂණ ආයතන විසින් 2023 වර්ෂයේදී සිදු කර ඇති පර්යේෂණ සංඛ්‍යාව කොපමණද;

(iv) එම පර්යේෂණවල ප්‍රධාන සොයාගැනීම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1090/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති කල්බදු සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) විධිමත් පරිදි ලියාපදිංචි කර නොමැති කල්බදු සමාගම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(iii) කල්බදු සමාගම් විසින් විවිධ පොලී අනුපාත අය කිරීම හේතුවෙන් එම සමාගම් සමඟ ගිවිසුම්ගත වී ඇති පාර්ශ්වයන් දැඩි අපහසුතාවකට පත් වී ඇති බව දන්නේද;

(iv) එම සමාගම් විසින් අය කරනු ලබන පොලී අනුපාතයන් නියාමනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් මේ වනවිට ක්‍රියාත්මක කර තිබේද;

(v) කල්බදු පහසුකම් ලබා ගන්නා ලද ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1130/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට බීජ ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) එම රටවලින් බීජ ආනයනය කරනු ලබන ආයතන/සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආනයනික බීජ මිල ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව දන්නේද;

(ii) ඒ හේතුවෙන් අසීරුතාවයට පත් වී ඇති ගොවියා / පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) සහන මිල ගණන් යටතේ ආනයනික බීජ ලබාදීමේ හැකියාවක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?